# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,578 — 1965 දෙසැම්බර් 4 වැනි සෙනසුරාදා — 1965.12.4**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## ආණ්ඩුවේ නිවේදන

### 1961 අංක 62 දරණ වෙළෙඳුන් හට බලපත්‍ර නිකුත් කිරීමේ පනත

1961 අංක 62 දරණ වෙළෙඳුන් හට බලපත්‍ර නිකුත් කිරීමේ පනතේ 3 වැනි හා 4 වැනි වගන්තිවලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වාණිජ හා වෙළඳ ඇමතිවරයා විසින් පනවන ලද නියෝගය යි.

ඇම්. ඩී. එච්. පීරිස්,
වාණිජ හා වෙළඳ ඇමති.

1965 දෙසැම්බර් මස 1 වැනි දින,
කොළඹ දී ය.

#### නියෝගය

1961 අගෝස්තු 10 හා අංක 12,575 ඒ දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, කලින් කල සංශෝධනය කරනු ලැබූ වෙළෙඳුන් හට බලපත්‍ර නිකුත් කිරීමේ 1961 (අංක 1 දරණ) නියෝග, පහත සඳහන් පරිදි, තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි ඇති " අ " උපලේඛනයෙහි " ගිණිකූරු " යන විෂයයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් විෂයයන් ඇතුළත් කිරීමෙන්—

බයිසිකල් ටයර් හා ටියුබ
විදුලිය පන්දම් බැටරි
ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි
ඇක්සසයිස් පොත් (පිටු 40 හා 80)
විදුලිය බුබුලු (වොට් 15 සිට වොට් 150 දක්වා වූ)
ලාම්පු මැන්ටල්
ඩ්‍රයි සෙල් බැටරි (වයර්ලස්)
කපු මහන නූල් (සුදු)
උදළු
ගොඩනැගිලි උපකරණ (යකඩ සහ වානේ)—

පොලු
කූරු
කෝණ ආකාර හා කොටයාශ
කහඩු
කොළ
එච්. යකඩ
වැනල් යකඩ
බෝල්ට් ඇණ හා මුරිච්චි
පයිප්ප
බී. ආර්. සී. ෆැබ්‍රික් ; සහ

(2) එහි " ඇ " උපලේඛනයෙහි " ගිණිකූරු " යන විෂයයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් විෂයයන් ඇතුළත් කිරීමෙන්—

බයිසිකල් ටයර් හා ටියුබ
විදුලිය පන්දම් බැටරි
ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැටරි
ඇක්සසයිස් පොත් (පිටු 40 හා 80)
විදුලිය බුබුලු (වොට් 15 සිට වොට් 150 දක්වා වූ)
ලාම්පු මැන්ටල්
ඩ්‍රයි සෙල් බැටරි (වයර්ලස්)
කපු මහණ නූල් (සුදු)
උදළු
ගොඩනැගිලි උපකරණ (යකඩ සහ වානේ)—

පොලු
කූරු
කෝණ ආකාර හා කොටයාශ
කහඩු
කොළ
එච්. යකඩ
වැනල් යකඩ
බෝල්ට් ඇණ හා මුරිච්චි
පයිප්ප
බී. ආර්. සී. ෆැබ්‍රික්.

12–464

---

## පොදු දැනගැනීම සඳහා දැන්වීමයි

### ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම්වල කාර්‍යයන් සඳහා දේශපාලන පක්ෂ පිළිගැනීම සම්බන්ධයෙන් වූ අළුත් ප්‍රතිපාදනයන්

1963 අංක 9 සහ 1965 අංක 15 දරණ පනත්වලින් සංශෝධිත පරිදි ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ, 27අ වැනි වගන්තියේ, (1), (2) සහ (3) වැනි උප වගන්තිවල විධිවිධානයන් ප්‍රකාර ප්‍රාදේශීය ඡන්ද විමසීම් වල කාර්‍යයන් සඳහා, පහත සඳහන් පක්ෂ, දේශපාලන පක්ෂ වශයෙන් පිළිගෙන ඇති අතර, මෙකී පක්ෂවල නිලමය අපේක්ෂකයන් සඳහා පහත දක්වෙන ලකුණු වෙන් කර ඇත.

| | දේශපාලන පක්ෂය | පක්ෂයේ අනුමත ලකුණ |
|---|---|---|
| 1. | සමස්ත ලංකා ද්‍රවිඩ සංගමය ... | ... බයිසිකලය |
| 2. | ලංකා කොමියුනිස්ට් පක්ෂය ... | ... තරුව |
| 3. | ඉලන්කායි තමිල් අරසු කච්චි (ෆෙඩරල් පක්ෂය) | ගෙය |
| 4. | ජාතික විමුක්ති පෙරමුණ ... | ... අහස්යානය |
| 5. | ලංකා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ... | ... ඉර |
| 6. | ලංකා සමසමාජ පක්ෂය ... | ... යතුර |
| 7. | මහජන එක්සත් පෙරමුණ ... | ... කරත්ත රෝදය |
| 8. | ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ... | ... අත |
| 9. | එක්සත් ජාතික පක්ෂය ... | ... අලියා |

2. පහසුවෙන් විමසා බලා ගැනීම සඳහා 27අ (1), (2) සහ (3) වැනි වගන්ති මෙහි පහත උපුටා දක්වා ඇත.

27අ. (1) මේ ආඥාවෙහි විධිවිධාන යටතේ හා ඒ අනුව, ප්‍රාදේශීය ඡන්ද විමසීම්වල කාර්‍යයන් සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකනු ලැබීමට දේශපාලන පක්ෂයකට හිමිකම් ලැබිය යුතුය.

(2) අපේක්ෂකයන් විසින් ගෙවිය යුතු ඇප මුදලට අදාල වූ, පාර්ලිමේන්තු මැතිවරණ රාජ සභා ආඥාවේ 29ඒ වන වගන්තියෙහි විධිවිධානවල කාර්‍ය්‍ය සඳහා ඒ ආඥාව යටතේ, එවැනි ප්‍රාදේශීය ඡන්ද විමසීම්වලට, අනන්තර පූර්වයෙන් පවත්වන ලද, පසු ගිය පාර්ලිමේන්තු මහා මැතිවරණයේදී පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් පිළිගනු ලැබුවේ නම්, එසේ පිළිගනු ලැබුවේ නම්, පමණක්, එම පක්ෂය ප්‍රාදේශීය ඡන්ද විමසීම්වල කාර්‍ය්‍ය සඳහා ද පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකනු ලැබීමට හිමිකම් ලැබිය යුතුය.

(3) (2) වන උප වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක වීම කරණ කොට ගෙන ප්‍රාදේශීය ඡන්ද විමසීම්වල කාර්‍ය්‍ය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් සලකනු ලැබීමට දේශපාලන පක්ෂයක් හිමිකම් ලබා ඇති විට, එවැනි ප්‍රාදේශීය ඡන්ද විමසීම්වලට අනන්තර පූර්වයෙන් වූ පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී පාර්ලිමේන්තු මැතිවරණ රාජසභා ආඥාව යටතේ එම පක්ෂයේ අපේක්ෂකයන්ට වෙන් කර දෙනු ලැබූ අනුමත කළ ලකුණ (2) වැනි උප වගන්තියේ බල තල ප්‍රකාර, හිමිකම් නතර වන දිනය වන තෙක් එම කාර්‍ය්‍ය සඳහා එවැනි පක්ෂයකට වෙන් කර දෙනු ලැබූ අනුමත කළ ලකුණ වශයෙන් සැලකිය යුතුය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්
(ප්‍රාදේශීය බල මණ්ඩල).

මැතිවරණ කොමසාරිස් කාර්‍ය්‍යාලය,
අංක 33, හෝර්ටන් පෙදෙස,
කොළඹ 7.
1965 නොවැම්බර් මස 29 වැනී දින දිය.

12–435

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අංක 27/65 දරණ ආනයන පාලන දැන්වීම

### විශේෂ බලපත්‍ර ලත් පශු වෛද්‍ය ඖෂධ ආනයනය

1964 දෙසැම්බර් මස 15 වැනි දින අංක 14,257 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරණ ලද අංක 25/64 දරණ ආනයන පාලන දැන්වීම සම්බන්ධවයි.

2. මෙම පාලනයෙන් නිකුත් කරණු ලැබූ බලපත්‍ර මත පහත ලැයිස්තුවෙ දැක්වෙන විශෙෂ බලපත්‍ර ලත් අතිරේක පශු වෛද්‍ය ඖෂධ ආනයනය කළ හැකි බව ආනයනකයින් වෙත මෙයින් දන්වනු ලැබේ.

3. ආනයන පාලන දැන්වීම 1/64, 12/64, 25/64, 27/64, හා 14/65 මීට අදාල වේ.

ඕ. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
ආනයන හා අපනයන පාලක.

1965 දෙසැම්බර් මස 3 දින,
කොළඹ දී ය.

විශේෂ බලපත්‍ර ලත් පශු වෛද්‍ය ඖෂධ

නිෂ්පාදකයෝ : බෙල් සහ පුත්‍රයෝ, එංගලන්තය
පයිපරසින් සයිට්‍රේට්

නිෂ්පාදකයෝ : බරෝස් වෙල්කම්, එංගලන්තය
ෆ්‍රැනොසයිඩ්
ස්කොලබන්

නිෂ්පාදකයෝ : කූපර්ස් මැක්ඩොගොල් සහ රොබර්ට්සන්, එංගලන්තය
ඩාවිසල්
ලොක්සන් '2'
ඩරිකිල්
කූපර්ගේ එන්. ඒෆ්. ඉසෙඩ්
ඇනබැක්
බැක්ටජන්ට්
කූපර්ගේ ඩෙයරි ඔයින්ට්මන්ට්
පෝල්ට්‍රි ලවුස් පවුඩර්
කැට්ල් ටික් ග්‍රීස්
කූපර්ටොක්ස්
බර්කොටොක්ස්

නිෂ්පාදකයෝ : ඩොක්ටර් සැලිස්බරිගේ රසායනාගාර, ඇමරිකා එක්සත් ජනපදය
ට්‍රිපල් සල්ෆා

නිෂ්පාදකයෝ : ග්ලැන්ඩ්–ඕ–ලැක්, ඇමරිකා එක්සත් ජනපදය
ට්‍රයිවර්ම් කැප්සියුල්ස්

නිෂ්පාදකයෝ : සීමිත, නිකොලස් පීටීවයි, ඔස්ට්‍රේලියාව
සල්ෆා–ජී
නියුට්‍රිවට්
පිප්සෝල්
ඇපැක්
රයිබොෆ්ලේවින් සමග ඇපැක්
මිනරල් මික්ස්චර්

12–436

---

### 1961 අංක 33 දරණ කෘෂි ද්‍රව්‍ය (නියමිත මිළ සහ වී පැහීම හා කෙටීමේ පාලනය) පනතේ 3 වැනි වගන්තිය යටතේ කරන නියෝගය

ගොවිජන සේවා කොමසාරිස් තැන්පත් ජෝසප් වැලන්ටයින් ෆොන්සේකා වන මම, 1961 අංක 33 දරණ කෘෂි ද්‍රව්‍ය (නියමිත මිළ සහ වී පැහීම හා කෙටීමේ පාලනය) පනතේ 3 වෙනි වගන්තිය යටතේ මට පැවරී ඇති බල තල අනුව නියමිත මිළ උපදේශක කාරක සභාව සමග සාකච්ඡා කිරීමෙන් පසු කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාගේ අනුමැතිය ඇතිව මුදල් ඇමතිතුමා සමග සාකච්ඡා කිරීමෙන් පසුව ලබා ගත් බලයද ඇතිව මෙම නියෝගයෙන් මෙහි පහත සඳහන් උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කෘෂි ද්‍රව්‍ය සඳහා එම උපලේඛනයේ 2 වෙනි තීරයේ දක්වා ඇති සහතික මිළ ගණන් නියම කරමි.

ජේ. වී. ෆොන්සේකා,
ගොවි ජන සේවා කොමසාරිස්.

1965 දෙසැම්බර් 3 වෙනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

| | 1 වෙනී තීරය | 2 වෙනි තීරය රු. | ශ. |
|---|---|---|---|
| | | බුසලක් | |
| 1. | වී ... ... ... ... | 12 | 0 |
| | | හොණ්ඩරයක් | |
| 2. | බඩ ඉරිඟු ... ... ... | 19 | 0 |
| 3. | කුරක්කන් වර්ග 1 ... ... ... | 15 | 0 |
| | වර්ග 2 ... ... ... | 13 | 0 |
| 4. | ඉදල් ඉරිඟු ... ... ... | 15 | 0 |
| 5. | තෝර පරිප්පු (ඇට) ... ... ... | 40 | 0 |
| 6. | මෙරට කපු වර්ග 1 ... ... ... | 57 | 0 |
| | අතිරේක වර්ගය ... ... | 50 | 0 |
| | වර්ග 2 ... ... ... | 45 | 0 |
| | වර්ග 3 ... ... ... | 36 | 0 |
| 7. | අබ ... ... ... | 54 | 0 |
| 8. | තල ... ... ... | 38 | 0 |
| 9. | මිරිස් වර්ග 1 ... ... ... | 252 | 0 |
| | වර්ග 2 ... ... ... | 196 | 0 |
| 10. | මුං ඇට වර්ග 1 ... ... ... | 49 | 92 |
| | වර්ග 2 ... ... ... | 40 | 32 |
| 11. | සියඹලා ... ... ... | 33 | 60 |
| 12. | කළු ගම්මිරිස් ... ... ... | 140 | 0 |
| 13. | මෑ ඇට ... ... ... | 33 | 60 |
| 14. | රට කජු ... ... ... | 49 | 28 |
| 15. | වියලි කහ ... ... ... | 84 | 0 |
| 16. | කෝපි වර්ග 1 ... ... ... | 224 | 0 |
| | වර්ග 2 ... ... ... | 154 | 0 |
| 17. | අර්තාපල් ... ... ... | 33 | 60 |
| 18. | රතුළූණු— | | |
| | ජනවාරි ... ... ... | 34 | 72 |
| | පෙබරවාරි ... ... ... | 31 | 36 |
| | මාර්තු ... ... ... | 25 | 76 |
| | අප්‍රියෙල් ... ... ... | 28 | 0 |
| | මැයි සහ ජූනි ... ... | 31 | 36 |
| | ජූලි ... ... ... | 22 | 40 |
| | අගෝස්තු ... ... ... | 25 | 76 |
| | සැප්තැම්බර් ... ... | 29 | 12 |
| | ඔක්තෝබර් ... ... | 31 | 36 |
| | නොවැම්බර් සහ දෙසැම්බර් ... ... | 34 | 72 |
| 19. | බොම්බයි ළූණු ... ... ... | 32 | 48 |

12–437

## රේගු නිවේදනය අංක 61/9/210

ආදයම් රක්ෂණ ආඥපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥව අනුව, 1965 දෙසැම්බර් මස 6 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—

| රබර් | රු. | ශ. |
|---|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට ... ... ... | 1 | 6 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට ... ... ... ... ... | 0 | 7 |

අංක ඊ. 781.
1965 දෙසැම්බර් මස 4 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දිය.

බී. නාරායනසාමි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

12–489

---

## රේගු දැන්වීම් අංක 64/5/70

1964 අගෝස්තු මස 8 වෙනි දින අංක 14,138 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1964.10.16 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරණ ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡෙදය යටතේ පැනෙන ආඥව ක්‍රියාත්මක කිරීම සඳහා, 1965 දෙසැම්බර් මස 6 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් අමෙරිකානු ඩොලර් 215 1/8 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | අමු පොල් ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|
| රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 286 43 — | 278 57 — | 236 57 — | 71 61 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

අංක ඊ. 744/22,
1965 දෙසැම්බර් මස 4 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දිය.

බී. නාරායනසාමි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

12–490

ලංකාවේ එම්බිලිපිටියෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.